# <u>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය</u>

## <u>ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව - 2016/2017</u>

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2016/2017 අධ්‍යයන වර්ෂයට පහත සඳහන් සුදුසුකම්ලත් අයගෙන් 2016/12/31 දිනට පෙර අයදුම් පත් කැඳවනු ලැබේ.

### <u>ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව</u>

01. අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණයෙන් විෂයන් 02 කින් සමත්වීම

හෝ

අ.පො.ස (සා.පෙළ) පරීක්ෂණයෙන් සිංහල භාෂාව ඇතුළුව විෂයන් 06 කින් සමත්වීම සහ ග්‍රාම සංවර්ධන ක්ෂේත්‍රයේ වසර 4 ට නොඅඩු පළපුරුද්දක් තිබීම.

හෝ

ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ වසර 10 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

02. පාඨමාලා ගාස්තුව රු 40,000/=

| | | |
|---|---|---|
| කාලය | : | එක් අවුරුදු පාඨමාලාවකි |
| දේශන | : | සෙනසුරාදා දිනවල පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා පැවැත්වේ. |
| මාධ්‍යය | : | සිංහල |

03. මෙම ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවනු ලබන පහත සඳහන් පාඨමාලා හැදෑරීමට සුදුසුකමක් වේ.

අ. සමාජීය විද්‍යාවේදී සංවර්ධන සහ පාරිසරික අධ්‍යයනය (බාහිර) උපාධි පාඨමාලාව
(කාලය වසර 3 යි)

04. මෙම පාඨමාලාවට ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල මෙන්ම ආසියානු කලාපයේ රටවල ග්‍රාමීය සංවර්ධනය ආශ්‍රිත අත්දැකීම් ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්ෂේත්‍රීය අධ්‍යයනද ඇතුලත් වේ.

05. අයදුම්පත සහ පාඨමාලාව පිළිබඳ විස්තර www.sjp.ac.lk/fhss වෙබ් අඩවියෙන් සහ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයට පැමිණ ලබාගත හැකිය. අදාල අයදුම්පත සමඟ ගංගොඩවිල මහජන බැංකු ශාඛාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨයේ ගිණුම් අංක 097100150005005 ට බැරවන පරිදි රු 500 ක මුදලක් ගෙවා ලබා ගත් රිසිට්පත **පාඨමාලා සමායෝජක, ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනයට එවන්න.

06. පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී මුළු පාඨමාලා ගාස්තුවෙන් තුනෙන් එක් කොටසක් පමණක් ගෙවා ඉතිරිය මාස හයක් ඇතුළත ගෙවිය හැකිය.

විමසීම් :- මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් මිය
පාඨමාලා සමායෝජක
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය
දු.අ. - 0112802028/ 0112758746/0112758753
E-mail – sunethrapk@gmail.com / sunethrapk@sjp.ac.lk

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ.
2016.08.25